OL/2015/11-S-I,II

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**11 | S | I, II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2015 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2015 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2015

බුද්ධ ධර්මය I, II
பௌத்தம் I, II
Buddhism I, II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

## බුද්ධ ධර්මය I

**සැලකිය යුතුයි :**

(i) **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
(ii) අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරා ගන්න.
(iii) **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**
(iv) එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

**1.** "මිනිස් පරපුර නමැති වෘක්ෂයේ අපමණ කලකට පසු ව පිපෙන, පිපුනාට පසු ව ප්‍රඥා සුගන්ධයෙන් සහ කරුණා මකරන්දයෙන් ලෝකය පුරවන අසාමාන්‍ය පුෂ්පය බුදුරජාණන් වහන්සේ ය." මෙලෙස පැවසුවේ,
(1) එච්. ජී. වෙල්ස් මහතා ය. (2) ජවහර්ලාල් නේරුතුමා ය.
(3) රිස් ඩේවිඩ්ස් පඬිතුමා ය. (4) ශ්‍රීමත් එඩ්වින් අර්නෝල්ඩ් මහතා ය.

**2.** සුද්ධෝදන රජතුමා සිය පුත් සිදුහත් කුමාරයාට පළමුවරට නමස්කාර කළේ,
(1) අසිත තවුසා නමස්කාර කළ අවස්ථාවේ දී ය.
(2) වප් මඟුල් දින ආනාපානසති භාවනාව වැඩූ අවස්ථාවේ දී ය.
(3) කොණ්ඩඤ්ඤ බමුණා නමස්කාර කළ අවස්ථාවේ දී ය.
(4) බමුණු පඬිවරුන් නම් තැබීමට පැමිණි අවස්ථාවේ දී ය.

**3.** සිදුහත් කුමාරයා ගිහිගෙයින් නික්ම තවුස් වෙස් ගෙන සත්‍ය සොයා යන ගමනේ දී මුලින් ම ගියේ,
(1) කාලදේවල හා ආළාරකාලාම තවුසන් වෙත ය.
(2) අසිත හා උද්දකරාමපුත්ත තවුසන් වෙත ය.
(3) ආළාරකාලාම හා උද්දකරාමපුත්ත තවුසන් වෙත ය.
(4) පස්වග තවුසන් වෙත ය.

**4.** "ගෘහපතිය, ඔබ තෙරුවන් සරණ ගිය ද ඔබ නිවසේ ජෛන පූජකයන්ට දුන් දන් එලෙස ම දෙන්න." බුදුරජාණන් වහන්සේ මෙසේ වදාළේ කා හට ද?
(1) අභයරාජ කුමාරයාට (2) උපාලි ගැහැවියාට
(3) බිම්බිසාර රජතුමාට (4) චිත්ත ගෘහපතියාට

**5.** වෙසක් පුන් පොහෝ දින ඇසතු රුක මුල කුසතණ අට මිටක් අතුරා සකස් කළ අසුනේ හිඳ සිදුහත් තවුසා බුද්ධත්වයට පත් විය. මෙම කුසතණ පූජා කරනු ලැබුවේ,
(1) උපක නම් බමුණකු විසිනි. (2) සොත්ථිය නම් බමුණකු විසිනි.
(3) හුහුංක නම් බමුණකු විසිනි. (4) වංකී නම් බමුණකු විසිනි.

**6.** බුදුරජාණන් වහන්සේ බුද්ධත්වයට පත්ව පස්වැනි සතිය ගත කළේ,
(1) බෝධි පර්යංකයේ ය. (2) අජපාල නුගරුක මුල ය.
(3) මුචලින්ද නා රජ සෙවණෙහි ය. (4) රාජායතන කිරිපලු රුක මුල ය.

**7.** බුදුරජාණන් වහන්සේට මුල් ම දානය පිළිගන්වනු ලැබුවේ කවුරුන් විසින් ද?
(1) සුජාතා සිටුදුව විසින් (2) අජාසත්ත රජතුමා විසින්
(3) තපස්සු-භල්ලුක දෙදෙනා විසින් (4) චුන්දකර්මාර පුත්‍රයා විසින්

[දෙවැනි පිටුව බලන්න.

**8.** සෝවාන් ඵලයට පත්ව සිටි පස්වග මහණුන් අර්හත්වයට පත් වූයේ,
(1) ධම්මචක්කපවත්තන සූත්‍රය ඇසීමෙනි. (2) ආදිත්තපරියාය සූත්‍රය ඇසීමෙනි.
(3) අනත්තලක්ඛණ සූත්‍රය ඇසීමෙනි. (4) සච්චවිභංග සූත්‍රය ඇසීමෙනි.

**9.** බුදුරජාණන් වහන්සේ දේශනා කර ඇති පරිදි, අනුන් සතු සැපතට ඊර්ෂ්‍යා **නොකරන්නා**,
(1) නීරෝගී වේ. (2) පොහොසතෙක් වේ.
(3) තේජස් ඇත්තෙක් වේ. (4) නුවණැත්තෙක් වේ.

**10.** පිප්ඵලි නම් මානවකයා පැවිදිව බුද්ධ ශාසනයට ඇතුළත්ව විශාල ශාසනික මෙහෙවරක යෙදුනේ ය. ඔහුගේ පැවිදි නම වන්නේ,
(1) මහා කස්සප හිමි යන්නයි. (2) මහා කච්චායන හිමි යන්නයි.
(3) මහා පන්ථක හිමි යන්නයි. (4) මහා මොග්ගල්ලාන හිමි යන්නයි.

**11.** විශාඛා මහා උපාසිකාව හා අනාථපිණ්ඩික සිටුතුමා බුදුරජාණන් වහන්සේට පූජා කළ ආරාම දෙක පිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.
(1) වේළුවනාරාමය හා පූර්වාරාමය (2) ජේතවනාරාමය හා වේළුවනාරාමය
(3) පූර්වාරාමය හා ඝෝෂිතාරාමය (4) පූර්වාරාමය හා ජේතවනාරාමය

**12.** ගෞතම බුදුරජාණන් වහන්සේගේ ජීවමාන සමයෙහි අවසන් ශ්‍රාවකයා ලෙස සැලකෙන්නේ,
(1) ධර්මාරාම හිමි ය. (2) අනුරුද්ධ හිමි ය.
(3) සුභද්ද හිමි ය. (4) කිම්බිල හිමි ය.

**13.** "බමුණ, ඔබගේ නිවසට පැමිණෙන ආගන්තුකයන් සඳහා පිළියෙල කරන ලද සංග්‍රහයක් ඔවුන් නොපිළිගන්නේ නම් එය ඔබට ම වන්නාක් මෙන් ඔබගේ සංග්‍රහය නොපිළිගන්නා බැවින් එය නැවතත් ඔබටම වේ." බුදුරජාණන් වහන්සේ මෙලෙස වදාළේ කා හට ද?
(1) කසීභාරද්වාජ නම් බමුණාට (2) අක්කෝස භාරද්වාජ නම් බමුණාට
(3) සෝණදණ්ඩ නම් බමුණාට (4) වච්ඡගොත්ත නම් බමුණාට

**14.** තෘෂ්ණා, මාන හා වැරදි දෘෂ්ටි ආදියෙන් තොරව කරුණා හා උපාය කුසලතා ආදියෙන් යුක්තව සිදුකරන දානාදී පුණ්‍යකර්ම හඳුන්වනු ලබන්නේ,
(1) පාරමිතා ධර්ම ලෙස ය. (2) රාජ ධර්ම ලෙස ය.
(3) ලෝකාධිපති ධර්ම ලෙස ය. (4) අත්තූපනායික ධර්ම ලෙස ය.

**15.** තමන්ගේ ජීවිතය ද පරිත්‍යාග කරමින් පෙරුම් දම් පිරීම හඳුන්වන්නේ,
(1) පාරමී ලෙස ය. (2) උපපාරමී ලෙස ය.
(3) පරමත්ථ පාරමී ලෙස ය. (4) දස පාරමී ලෙස ය.

**16.** අප බෝසතාණන් වහන්සේ නෙක්ඛම්ම පාරමිතාව පුගුණ කළ ආකාරය හෙළිවන ජාතක කථාව කුමක් ද?
(1) තේමිය ජාතකය (2) වට්ටක ජාතකය
(3) මස මානවක ජාතකය (4) මඛාදේව ජාතකය

**17.** සංඝරත්නයේ ගුණ ප්‍රකාශ වන තැන "ආගන්තුකයන් සඳහා සූදානම් කළ ආහාරය වුව ද පිළිගැන්වීමට සුදුසු ය." යන ගුණය ප්‍රකාශ වන්නේ,
(1) ආහුණෙය්‍යෝ යන්නෙනි. (2) පාහුණෙය්‍යෝ යන්නෙනි.
(3) දක්ඛිණෙය්‍යෝ යන්නෙනි. (4) අඤ්ජලිකරණීය යන්නෙනි.

**18.** ධර්මයෙහි සඳහන් වන පරිදි ඡන්දය, දෝසය, භය හා මෝහය යන කරුණු හැඳින්වෙන්නේ කුමන නමින් ද?
(1) සතර අගති නමින් (2) සතර දුගති නමින්
(3) සතර කාමගති නමින් (4) සතර කර්ම ක්ලේශ නමින්

**19.** "වෛර කරන මිනිසුන් අතර අපි වෛර නොකර සුවසේ වෙසෙමු." යන අදහස ඇතුළත් ධම්මපද ගාථාවේ මුල් දෙපදය වන්නේ,
(1) "සුසුඛං වත ජීවාම - වෙරිනෙසු අවෙරිනො" යන්නයි.
(2) "න හි වෙරෙන වෙරානි - සම්මන්තීධ කුදාචනං" යන්නයි.
(3) "අත්තනාව කතං පාපං - අත්තනා සංකිලිස්සති" යන්නයි.
(4) "සාරං ච සාරතො ඤත්වා - අසාරං ච අසාරතො" යන්නයි.

[තුන්වැනි පිටුව බලන්න.

**20.** මෙත් වඩන්නකු තුළ තිබිය යුතු ගුණාංගයකි, 'නුවණ ඇති බව'. කරණීයමෙත්ත සූත්‍රයේ මෙම ගුණය හැඳින්වෙන්නේ,
(1) සුවචො නමින් ය. (2) සුභරො නමින් ය.
(3) නිපකො නමින් ය. (4) අනතිමානි නමින් ය.

**21.** සතර සංග්‍රහ වස්තුවලට අයත් **නො වන** ධර්ම කරුණක් සඳහන් වන වරණය තෝරන්න.
(1) දානය (2) සීලය (3) ප්‍රිය වචනය (4) සමානාත්මතාවය

**22.** බුද්ධාදී අටතැන්හි ඇති වන සැකය, විමතිය හෙවත් අවිශ්වාසය බුදුදහමේ හැඳින්වෙන්නේ,
(1) ව්‍යාපාද ලෙස ය. (2) ථීනමිද්ධ ලෙස ය.
(3) උද්ධච්ච කුක්කුච්ච ලෙස ය. (4) විචිකිච්ඡා ලෙස ය.

**23.** බෞද්ධ ඉගැන්වීම්වල ලාභ-අලාභ, යස-අයස ආදී කරුණු හැඳින්වෙන්නේ,
(1) ලෝක පාලක ධර්ම ලෙස ය. (2) ලෝකාධිපති ධර්ම ලෙස ය.
(3) අෂ්ට ලෝක ධර්ම ලෙස ය. (4) අත්තාධිපති ධර්ම ලෙස ය.

**24.** සිත, කය හා වචනය යන තුන් දොරින් කරන කුසලා'කුසල ක්‍රියාවලට පසුබිම වන ශක්තිය ධර්මයේ හැඳින්වෙන්නේ,
(1) වේදනා ස්කන්ධය නමිනි. (2) සඤ්ඤා ස්කන්ධය නමිනි.
(3) සංඛාර ස්කන්ධය නමිනි. (4) විඤ්ඤාණ ස්කන්ධය නමිනි.

**25.** තම ගොවිතැන්වලින් ලබා ගන්නා අස්වැන්නේ පළමු කොටස ජය ශ්‍රී මහා බෝ සමිඳුට පූජා කොට ආශීර්වාද ලබා ගැනීම සිංහලයන්ගේ සිරිතකි. එම පූජාව හඳුන්වන නම කුමක් ද?
(1) කිරි භණ්ඩ පූජාව (2) අග්‍රශස්‍ය දානය
(3) අටවිසි බුද්ධ පූජාව (4) දේවතා බලි දානය

**26.** "මෙය ඇති කල්හි මෙය වේ. මෙය නැති කල්හි මෙය නො වේ." (ඉමස්මිං සති ඉදං හොති, ඉමස්මිං අසති ඉදං න හොති) යන මෙම ධර්ම පරියාය බුදුදහමේ හැඳින්වෙන්නේ,
(1) පුබ්බේකතහේතුවාද නමිනි. (2) අහේතුඅප්පච්චයතාවාද නමිනි.
(3) පටිච්චසමුප්පාද නමිනි. (4) ඉස්සරනිම්මාණවාද නමිනි.

**27.** බෞද්ධ හේතුඵල ධර්මයට අනුව "විඤ්ඤාණය හෙවත් ප්‍රතිසන්ධි සිත ඇති කල නාමරූප ඇති වේ." යන්න ප්‍රකාශ වන්නේ,
(1) "සංඛාර පච්චයා විඤ්ඤාණං" යන්නෙනි. (2) "විඤ්ඤාණ පච්චයා නාමරූපං" යන්නෙනි.
(3) "නාමරූප පච්චයා සළායතනං" යන්නෙනි. (4) "තණ්හා පච්චයා උපාදානං" යන්නෙනි.

**28.** කර්මය පිළිබඳ බෞද්ධ විග්‍රහයට අනුව තුන්වැනි භවයේ සිට ඉඩ ලැබෙන අවස්ථාවල විපාක දෙන කර්ම හඳුන්වනු ලබන්නේ,
(1) දිට්ඨධම්ම වේදනීය කර්ම ලෙස ය. (2) උපපජ්ජ වේදනීය කර්ම ලෙස ය.
(3) අපරාපරිය වේදනීය කර්ම ලෙස ය. (4) අහෝසි කර්ම ලෙස ය.

**29.** ගිහියකුට අත්විඳීමට හැකි සැප අතර ණය බරින් තොර ව ජීවත්වීමේ සතුට හැඳින්වෙන්නේ,
(1) අත්ථි සුඛ නමින් ය. (2) භෝග සුඛ නමින් ය.
(3) අණන සුඛ නමින් ය. (4) අනවජ්ජ සුඛ නමින් ය.

**30.** කෙනෙක් ධර්මානුකූල ව උපයාගත් ධනය තම ආදායමට අනුව වැය කරමින් මධ්‍යස්ථ ජීවිතයක් ගත කිරීමට පුරුදුව සිටිති. එසේ ජීවිතය ගත කිරීම,
(1) උට්ඨාන සම්පදා නමින් හැඳින්වේ. (2) ආරක්ඛ සම්පදා නමින් හැඳින්වේ.
(3) සමජීවිකතා නමින් හැඳින්වේ. (4) කල්‍යාණ මිත්තතා නමින් හැඳින්වේ.

**31.** ධර්මාශෝක රජු විසින් සිදු කළ දේශාන්තර ධර්ම දූත මෙහෙවරේ දී අපරන්ත දේශයට වැඩම කොට අග්ගික්ඛන්ධෝපම සූත්‍රය දේශනා කළේ,
(1) මජ්ඣිම තෙරුන් ය. (2) රක්ඛිත තෙරුන් ය.
(3) මහා ධම්මරක්ඛිත තෙරුන් ය. (4) යෝනක ධම්මරක්ඛිත තෙරුන් ය.

**32.** දසරාජ ධර්මවල විස්තර වන ආකාරයට පාලකයකු ආවේගශීලී නොවී කටයුතු කිරීම හැඳින්වෙන්නේ,
(1) ඍජු බව නමිනි. (2) තපස නමිනි. (3) අක්‍රෝධ නමිනි. (4) ඉවසීම නමිනි.

[හතරවැනි පිටුව බලන්න.

249440

**33.** සිගාලෝවාද සූත්‍රයේ දැක්වෙන පරිදි දෙමාපියන් විසින් තම දූ දරුවන්ට ඉටු කළ යුතු යුතුකම් ගණයට අයත් **නො වන** කරුණක් වන්නේ පහත සඳහන් කවරක් ද?
(1) පවින් වැළැක්වීම (2) යහපතෙහි යෙදවීම
(3) උරුම දේපළ ආරක්ෂා කිරීම (4) සුදුසු කල දායාද පවරාදීම

**34.** මෛත්‍රී වැඩීමෙන් ලැබෙන ආනිසංස ගණයට අයත් **නො වන** කරුණක් දැක්වෙන වරණය තෝරන්න.
(1) නපුරු සිහින දැකීම (2) දෙවියන් විසින් රකිනු ලැබීම
(3) සිත වහා සමාධිගත වීම (4) සිහි මුළාවෙන් තොරව කලුරිය කිරීම

**35.** පළමුවැනි ධර්ම සංගායනාවේ දී ධර්ම විනය කටපාඩමින් රැකගෙන යාමට භික්ෂු පරම්පරාවන්ට පැවරුණු අතර සැරියුත් තෙරුන්ගේ ශිෂ්‍යා'නුශිෂ්‍ය පරපුරට පැවරුණේ,
(1) දීඝ නිකායයි. (2) මජ්ඣිම නිකායයි.
(3) අංගුත්තර නිකායයි. (4) සංයුක්ත නිකායයි.

**36.** දෙවැනි ධර්ම සංගායනාවේ ප්‍රතිඵල ගණයට අයත් **නො වන** කරුණක් වන්නේ පහත සඳහන් කවරක් ද?
(1) දස අකැප වස්තුව ප්‍රතික්ෂේප වීම
(2) ථෙරවාදී ධර්ම විනය දුර්මතධාරීන්ගෙන් ආරක්ෂා කර ගැනීම
(3) භික්ෂු පිරිස කොටස් දෙකකට බෙදී යාම
(4) නවරට සසුන් පිහිටුවීම

**37.** බුදුරජාණන් වහන්සේගේ පුරිසදම්මසාරථි ගුණය විස්තර කරමින් පැරණි ශ්‍රී ලංකාවේ සිංහල භාෂාවෙන් රචිත පැරණි ම ගද්‍ය කෘතියේ කතුවරයා කවු ද?
(1) ගුරුළුගෝමී පඬිතුමා (2) විද්‍යා චක්‍රවර්ති පඬිතුමා
(3) ධර්මසේන මාහිමි (4) බුද්ධපුත්‍ර මාහිමි

**38.** "කාලා රසමුසු බෝජන කර පෙම්
ගාලා සුවඳැති සඳුනුත් මනරම්
ලාලා අබරණ නිසි ලෙස සැරහුම්
පාලා ගිය වැනි බහුරූ කෝලම්"

සාරධර්ම සංවර්ධනයෙන් තොර ජීවිතයේ නිසරු බව දැක්වෙන ඉහත කවිය උපුටා ගෙන ඇති ග්‍රන්ථය කුමක් ද?
(1) තොටගමුවේ ශ්‍රී රාහුල හිමිගේ කාව්‍යශේඛරය
(2) වීදාගම මෛත්‍රී හිමිගේ ලෝවැඩ සඟරාව
(3) රණස්ගල්ලේ හිමිගේ ලෝකෝපකාරය
(4) අලගියවන්න මුකවෙටිතුමාගේ සුභාෂිතය

**39.** "මාගේ මේ ව්‍යායාමය හුදෙක් රජ සැප පිණිස නොව සම්බුද්ධ ශාසනයේ චිරස්ථිතිය සඳහා ය." යන මේ ආදර්ශය පෙරටු කොට ගෙන කටයුතු කළ රාජ්‍ය පාලකයා වන්නේ,
(1) කාවන්තිස්ස රජතුමා ය. (2) දුටුගැමුණු රජතුමා ය.
(3) සද්ධාතිස්ස රජතුමා ය. (4) මහා පරාක්‍රමබාහු රජතුමා ය.

**40.** ශ්‍රී ලංකාවේ පැරණි ආගමික ගොඩනැගිලිවලට ඇතුළු වන පියගැට පෙළ ආරම්භයේ ඇති ගලින් නිම කරන ලද අර්ධ කවාකාර නිර්මාණය හැඳින්වෙන නම කුමක් ද?
(1) කොරවක්ගල (2) මුරගල (3) වාමනරූප (4) සඳකඩ පහණ

* *

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

11 S I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2015 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2015 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2015

බුද්ධ ධර්මය I, II
பௌத்தம் I, II
Buddhism I, II

## බුද්ධ ධර්මය II

* **පළමුවැනි** ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න **හතරක්** ඇතුළු ව ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.
* පළමුවැනි ප්‍රශ්නයට ලකුණු **20** ක් ද තෝරා ගන්නා අනෙක් ප්‍රශ්නයකට ලකුණු **10** බැගින් ද හිමි වේ.

**1.** (i) බුදුරජාණන් වහන්සේගේ ප්‍රථම ධර්ම දේශනය ලෙස ප්‍රකට සූත්‍රයේ නම කුමක් ද?

(ii) බුදුදහමේ ඉගැන්වෙන ප්‍රධාන භාවනා ක්‍රම **දෙක** කවරේ ද?

(iii) "යො ධම්මං පස්සති සො පටිච්චසමුප්පාදං පස්සති" මෙම පාඨයේ අදහස ලියන්න.

(iv) සිවු බඹ විහරණ ලියා දක්වන්න.

(v) "නහි වෙරෙන වෙරානි - සම්මන්තීධ කුදාචනං
අවෙරෙන ච සම්මන්ති - එසධම්මො සනන්තනො" මෙම ගාථාවේ අදහස ලියන්න.

(vi) ත්‍රිලක්ෂණය නම් කරන්න.

(vii) ජාතක කථා පාදක කොට කෝට්ටේ යුගයේ දී ලියැවුණු කාව්‍ය ග්‍රන්ථ **දෙකක්** ලියා දක්වන්න.

(viii) බුදුදහමේ දැක්වෙන පරිදි සිත කිලිටි කරන අකුසල මූල **තුන** නම් කරන්න.

(ix) අනුරාධපුර යුගයේ රාජ්‍ය පාලකයින් දෙදෙනකු වූ වළගම්බා සහ මහසෙන් යන රජවරුන් විසින් ඉදි කළ ස්තූප **දෙකේ** නම් ලියන්න.

(x) සතර සතිපට්ඨාන ලියා දක්වන්න.

**2.** (i) සිදුහත් කුමරු දුටු සතර පෙර නිමිති මොනවා ද?

(ii) මහා අභිනිෂ්ක්‍රමණයේ සිට බුද්ධත්වය දක්වා සිදුහත් සිරිතේ ප්‍රධාන සිදුවීම් ලියන්න.

(iii) "ළමා අවධියේ සිට ම පරාර්ථකාමී වීම ජීවිතයට අත්‍යවශ්‍ය ගුණයකි." බුදු සිරිත ඇසුරෙන් මෙය සාකච්ඡා කරන්න.

**3.** (i) "ඇසුරු කිරීමට තමන්ට වඩා උසස් අයකු හෝ සමාන අයකු හෝ නොමැති නම් හුදෙකලාව වාසය කිරීම සුදුසු ය." මේ බව අවධාරණය කෙරෙන ධම්මපද ගාථාව ලියන්න.

(ii) එම ගාථාවේ දැක්වෙන 'බාලයා' යනු කවුරුන් දැයි පැහැදිලි කරන්න.

(iii) ජීවිතය සාර්ථක කර ගැනීමට ධම්මපදයෙන් ඔබට ලැබෙන උපදෙස් ඇගයීමට ලක් කරන්න.

**4.** (i) ආර්ය සත්‍යය හතර නම් කරන්න.

(ii) "සම්මා වාචා" යන්න ධර්මානුකූල ව පැහැදිලි කරන්න.

(iii) මධ්‍යම ප්‍රතිපදාව ජීවිත කාලය තුළ දී ම සැනසීම ලබා දෙන මාර්ගයක් බව පෙන්වා දෙන්න.

**5.** (i) ශ්‍රී ලංකාවේ බෞද්ධ පාසල් ආරම්භ කිරීමට, සර් හෙන්රි ස්ටීල් ඕල්කට්තුමන් විසින් ගත් පියවර හඳුන්වන්න.

(ii) ඩේවිඩ් හේවාවිතාරණ තරුණයා අනගාරික ධර්මපාල බවට පත් වූ අයුරු දක්වන්න.

(iii) "මානසික වහල්භාවය නමැති අන්ධකාරයේ නිමග්නව සිටි සිංහල බෞද්ධයන්ට ආලෝකය සැපයූ ප්‍රදීපස්තම්භයක් ලෙස ශ්‍රීමත් අනගාරික ධර්මපාලතුමා හැඳින්විය හැකි ය." මෙම ප්‍රකාශය පැහැදිලි කරන්න.

[හයවැනි පිටුව බලන්න.

**6.** (i) තෙවැනි ධර්ම සංගායනාව පැවැත්වීමට තුඩුදුන් හේතු මොනවා ද?

(ii) තෙවැනි ධර්ම සංගායනාව සම්බන්ධ ව අසා ඇති පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

* සංගායනාව සඳහා මූලිකත්වය ගෙන ක්‍රියා කළ රහතන් වහන්සේ කවු ද?
* සංගායනාවට අනුග්‍රහය ලබා දුන් රාජ්‍ය පාලකයා කවු ද?
* සංගායනාව පැවැත් වූ ස්ථානය නම් කරන්න.

(iii) ථේරවාද බුද්ධදහමේ දේශාන්තර ව්‍යාප්තිය සඳහා තෙවැනි ධර්ම සංගායනාව ඉවහල් වූ අයුරු විස්තර කරන්න.

**7.** (i) ඉරියව් අනුව බුද්ධ ප්‍රතිමා බෙදා දක්වන වර්ග **තුන** නම් කරන්න.

(ii) බුද්ධ ප්‍රතිමා නිර්මාණකරණයේ ආරම්භය හා විකාශය සිදු වූ අයුරු පහදන්න.

(iii) බුදුරජාණන් වහන්සේගේ ආධ්‍යාත්මික ගුණ ප්‍රකට වන අයුරෙන් ශ්‍රී ලාංකික කලා ශිල්පීන් බුද්ධ ප්‍රතිමා නිර්මාණයේ යෙදී ඇති අයුරු නිදසුන් ඇසුරෙන් විස්තර කරන්න.

* * *

PAST PAPERS WIKI

ප්‍රශ්නපත්‍ර පොත්
ගෙදරටම ගෙන්වා ගන්න
ඔන්ලයින් ඕඩර් කරන්න
www.store.pastpapers.wiki
වෙත යන්න

BUY NOW

Secure Payments By PayPal
NO PAYPAL ACCOUNT NEEDED!

ONLINE
BOOK STORE

An evening of fun for young readers

